රුහුණ විශ්වවිද්‍යාලය

2016/2017 ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි - 2000 ස්ථලය
දෙවන සමාසික පරීක්ෂණය - 2018 මැයි

SLS 22573 – සම්භාව්‍ය සිංහල පද්‍ය සාහිත්‍යය

පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

කාලය : පැය 03

---

01. පහත දැක්වෙන පද්‍යවල අර්ථය ලිහිල් බසින් ලියන්න.

i. කලහස සර සමත සර බිඹුවැල නිලුපුලෙන්
ගමන් පිය තෙපල ලවන් නුවන දැකැ ද නොවෙහෙම්

සමඟ පබවත යන ගියෙ සිතු ම දෙස නොබලා
නිරතුරු මෙ වේ විඳුනෙම් පරමතුරුතුරු නො කෙළෙම්

කව්සිළුමිණ, සංස්. ඇම්.බී. ආරියපාල, 562, 563 ගී

ii. රිවි තෙද දිමුත හිමි හිමකර විලසි වනි
සොමි ගුණ රසට සොමි සඳ කරවනු කෙවැනි
විළි බිය දෙකින් ගැලවිය හැකි දැයි සිතිනි
එ දෙදෙන තමන් සැටි ඇර වෙස් වළන වැනි

සෙත යැදි සත්හට දෙන දිගු බිත ඉසිරි
පිරි මුළු සක්වල පුල් සුරිඳු යස සිරි
ලෙස වෙසෙසක් කැර නතනා හටත් සරි
වත දහසක් තව ලදුවත් වණනු බැරි

මයුර සන්දේශය, සංස්. කුමාරතුංග මුනිදාස, 65,151 පද්‍ය

iii. දත් මැදලා — දමන
දැහැටි දඬු මෙන් දින — දින
මෙහෙ ගෙන දනන් — ගෙන
පසුව නොදමති නොදත්තන් — මෙන

පියුමෙහි මී විලෙ — හි
තබා බොන හස මෙන් — මෙහි
දන දනවතුන් — ගෙහි
තබා වැඩ විඳ ගනිති නිති — එහි

බුදුගුණ අලංකාරය, සංස්. කිරිඇල්ලේ ඤාණවිමල හිමි, 62 65 පද්‍ය

iv. නො මිහිරි ද මේ — වෙණ
ඇසුවහු ද මින් වැඩි — වෙණ
නැතහොත් නැත — නුවණ
කියව නොසතුටු වන්ට — කාරණ

ඇදුර තුටු නො — වෙතී
නොසිත'ප සිප් නො — දනිතී
උනිමු වෙණ — සදතී
නොදත්තෙමු ගායනා — කරතී

ගුත්තිල කාව්‍යය, සංස්. අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, 144, 145 පද්‍ය

(ලකුණු 20)

02. පද්‍යයෙන් බුදු සිරිත ඉදිරිපත් විය යුතු බවට සියබස්ලකරෙන් දක්වන ලද නිර්දේශයත්, සංස්කෘත සාහිත්‍යයෙන් ලද ආභාසයත් සම්මිශ්‍රිත ව සම්භාව්‍ය සිංහල පද්‍ය සාහිත්‍යය විකාසය වූ ආකාරය පහදන්න.

03. කව්සිළුමිණෙහි කුස රජුගේ චරිතය නිරූපණය කොට ඇති ආකාරය අදාළ වර්ණනා ඇසුරෙන් පැහැදිලි කරන්න.

04. සාම්ප්‍රදායික කවි සමයෙහි එන සංකල්ප නව ආකාරයකින් ප්‍රතිනිර්මාණයට මයූර සන්දේශකරු දක්වා ඇති නෛපුණ්‍යය සනිදර්ශන ව විභාග කරන්න.

05. ගුත්තිල කාව්‍ය නිර්මාණයේ දී කවියා තෝරාගත් කාව්‍ය ආකෘතිය කවරේ දැයි පැහැදිලි කරන්න.

06. "සෙසු ආගම්වල නිස්සාරත්වය පළ කරමින් බුදු දහමෙහි ශ්‍රේෂ්ඨත්වය විදහා පෑමට බුදුගුණ අලංකාර කවියා උත්සුක වී ඇත". විමසන්න.

07. අලගියවන්න මුකවෙටි කවියාගෙන් සිදුවූ සාහිත්‍ය සේවය පිළිබඳ විචාරාත්මක ලිපියක් ලියන්න.

(02 -07 දක්වා සෑම පිළිතුරකට ම ලකුණු 10 බැගිනි.)

@@@@@@@